# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1544/17 - 2008 අප්‍රේල් 10 වැනි බ්‍රහස්පතින්දා - 2008.04.10

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**(52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනත**

(52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වන වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදය සමග කියවිය යුතු, සුරාබදු ආඥාපනතේ 32 වන වගන්තිය යටතේ ජනාධිපති විසින් සාදන ලද රීති.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2008 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

රීති

1. මෙම රීති "සුරාබදු නිවේදන අංක 902" යනුවෙන් සඳහන් කරනු ලබන අතර, ඒවා මෙම නිවේදනය පල කරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. මෙම රීති ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ එදිනට පසුව, මේ රීතිවල 1 වන උපලේඛනයේ, 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති (මෙහි මින් මතු "ආඥාපනත" යනුවෙන් මෙම රීතිවල සඳහන් කරනු ලබන) (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥා පනත ප්‍රකාර කවර හෝ වර්ගයක බලපත්‍රයක් ලබා ගැනීමට අදහස් කරන සියළු තැනැත්තන් විසින් මේ රීතිවල 11 වන උප ලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඉල්ලුම් පත්‍රයෙහි සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

3. 2 වන රීතිය යටතේ සියලුම ඉල්ලීම් ලැබීමේදී, කොමසාරිස් ජනරාල්වරයා විසින් ආඥාපනතේ විධිවිධාන අනුව එම ඉල්ලුම් පත්‍ර සලකා බලා එම ඉල්ලුම් පත්‍ර මේ රීතිවල 111 වන උප ලේඛනයේ නිශ්චිතව දක්වා ඇති මාර්ගෝපදේශ සහ කොන්දේසිවලට එම ඉල්ලුම් පත්‍ර අනුකූල බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්විය යුතු ය. යම් වර්ෂයක ජනවාරි මස 01 වැනි දිනයෙන් ආරම්භ වී එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන යම් මුදල් වර්ෂයක් සම්බන්ධයෙන් සියළු වර්ගවල මත්පැන් බලපත්‍ර නිකුත් කිරීම සඳහා මෙම මාර්ගෝපදේශ සහ කොන්දේසි වෙනස් කරන තුරු හෝ පරිච්ඡින්න කරන තුරු අදාල විය යුතු ය.

4. මෙහි 1 වන උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දැක්වෙන බලපත්‍ර වර්ගයක් සම්බන්ධයෙන් බලපත්‍රයක් නිකුත් කිරීමට ඇති සෑම ඉල්ලුම්කරුවකු විසින් ම, එම බලපත්‍රය අදාල වන පරිශ්‍රය මෙම රීතිවල 1 වන උප ලේඛනයේ නිශ්චිතව දක්වා ඇති iv වන උප ලේඛන අදාල වන පරිශ්‍රය අනුමත කිරීම සඳහා වූ නිර්ණායකවලට අනුකූල විය යුතු ය.

5. මේ රීති යටතේ දී, බලපත්‍රයක් ප්‍රදානය කරනු ලබන්නේ යම් තැනැත්තකු වෙත ද, එවැනි සෑම තැනැත්තකු විසින්ම, මේ රීතිවල 1 වන උප ලේඛනයේ 11 වන තීරයේ දක්වා ඇති මුදලකින් සමන්විත වන්නා වූ ද, තමා වෙත නිකුත් කරනු ලැබූ අදාල බලපත්‍ර වර්ගය සඳහා නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, වාර්ෂික බද්ද ගෙවනු ලැබිය යුතු ය.

6. බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබූ සෑම තැනැත්තකු විසින් ම ආඥා පනත මගින් නියම කර ඇති පරිදි තම බලපත්‍රයේ කාල සීමාව ආවරණය කිරීම සඳහා ගිවිසුමක් ලියා අත්සන් කල යුතු අතර, තමා ඉල්ලුම් කරන අදාල බලපත්‍ර වර්ගය සඳහා මෙම රීතිවල 1 වන උප ලේඛනයේ 11 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති මුදලකින් ඔහුගේ ගිවිසුම යථා පරිදි ඉටු කිරීම සඳහා ඇපයක් ඉදිරිපත් කල යුතු ය.

7. 2003 සැප්තැම්බර් මස 22 වන දින අංක 1307/3 දරණ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පල කරනු ලැබූ අංක 859 දරන සුරාබදු නිවේදනය, 2003 ඔක්තෝබර් මස 10 වන දින අංක 1309/19 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවැරදි කිරීම් සහ 2004.මැයි මස 20 වන දින අංක 1341/28 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පල කරන ලද අංක 873 දරන සුරාබදු නිවේදනය සහ 2005 දෙසැම්බර් මස 19 වන දින අංක 1424/7 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 887 දරන සුරාබදු නිවේදනය, 2006.08.03 වන දින අංක 1456/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පල කරන ලද අංක 888 දරන සුරාබදු නිවේදනය හා 2006.12.29 වන දින අංක 1477/25 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පල කරන ලද අංක 892 දරන සුරාබදු නිවේදනය යන සියළු ලේඛන මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

**'අ' උපලේඛනය**

***වාර්ෂික බලපත්‍ර ගාස්තු/ ගෙවිය යුතු ඇපය***

| *1 වන තීරුව* | | *11 තීරුව* | |
|---|---|---|---|
| | *බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය* | *වාර්ෂික බලපත්‍ර ගාස්තුව රුපියල්* | *ඇපය රුපියල්* |
| 1. | ධාන්‍ය මත්පැන් නිෂ්පාදනය කිරීමේ බලපත්‍රය | 10,000.00 | 50,000.00 |
| 2. | මෙරට සෑදූ විදේශ මත්පැන් නිෂ්පාදනය කිරීමේ බලපත්‍රය | 6,000.00 | 5,000.00 |
| 3. | කිරිපොන්සා සහ / හෝ වයින් නිෂ්පාදනය, බෝතල් ගත කිරීම සහ විකිණීම සඳහා දෙන බලපත්‍රය | 500.00 | |
| 4. | තාල වර්ගයට අයත් ශාකයක ස්වාභාවික නිෂ්පාදිතයකින් හෝ වෙනත් ඕනෑම පැලෑටියක ස්වභාවික නිෂ්පාදනයකින් සාදන ලද මධ්‍යසාර 4% පරිමාවකට වඩා අඩංගු නොවන සහ ආසවනය හැරෙන්නට වෙනත් ක්‍රියාවලියකින් නිෂ්පාදනය කරන මත්පැන් නිෂ්පාදනය, බෝතල් ගත කිරීම සහ විකිණීම සඳහා දෙන බලපත්‍රය | 100.00 | |
| 5. | ඕනෑම තාල වර්ගයේ ගසකින් ලබා ගන්නා ස්වාභාවික ද්‍රව්‍ය හෝ වෙනත් පැලෑටිවලින් හෝ ආසවනය කිරීම හැර වෙනත් ක්‍රියාවලියකින් රා හැරෙන්නට ධාන්‍යයෙන් තැනූ මධ්‍යසාර 4% පරිමාවකට වඩා අඩංගු මත්පැන් නිෂ්පාදනය කිරීමට දෙන බලපත්‍රය | 1000.00 | |
| 6. | ටී සයිඩර් නිෂ්පාදනය සඳහා දෙන බලපත්‍රය | 200.00 | |
| 7. | යාපනය දිස්ත්‍රික්කයේ ගස් මැදීමට දෙන බලපත්‍රය<br>පිරිමි තල් (ගසකට)<br>ගැහැණු තල් (ගසකට)<br>පොල් (ගසකට)<br>කිතුල් ගස් මැදීමට (වර්ෂයක් සඳහා) දෙන බලපත්‍රය | <br>25.00<br>35.00<br>35.00<br>50.00 | |
| 8. | රා නොවන පොල් වලින් හෝ එහි වෙනත් නිෂ්පාදනයකින් හෝ ආසවනය කරන ස්ප්‍රීතුවලින් මෙරට සාදන "විදේශීය" ස්ප්‍රීතු වර්ග නිෂ්පාදනය කිරීම සඳහා දෙනු ලබන බල පත්‍රය | 5,000.00 | 5,000.00 |
| 9. | ස්කාගාර බලපත්‍රය | 10,000.00 | 5,000.00 |
| 10. | ගබඩා සහ ගුදම් බලපත්‍රය | 5,000.00 | නැත |

| 1 වන තීරුව | | 11 තීරුව | |
|---|---|---|---|
| | බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රුපියල් | ඇපය රුපියල් |
| 11. | නිෂ්පාදකයන්ගේ තොග වෙළඳ අරක්කු/බියර්/විදේශීය මත්පැන් බෙදා හැරීමේ බලපත්‍රය | 75,000.00 | 50,000.00 |
| 12. | රා බෝතල් ගත කිරීමේ බලපත්‍රය | 5,000.00 | |
| 13. | විනාකිරි නිෂ්පාදනාගාර බලපත්‍රය | 200.00 | |
| 14. | විනාකිරි සඳහා ගස් මැදීමේ බලපත්‍රය (ගසකට) | 25.00 | |
| 15. | මත්පැන් සඳහා තොග වෙළඳ බලපත්‍රය (ර. බී.3) | 3,75,000.00 | 50,000.00 (අරක්කු සඳහා පමණි) |
| 16. | මත්පැන් සඳහා සිල්ලර බලපත්‍ර (ර.බී.4)<br>1. මහ නගර සභා ප්‍රදේශ<br>2. නගර සභා ප්‍රදේශ<br>3. අනෙකුත් ප්‍රදේශ<br>4.ඉල්ලුම්කාර ව්‍යාපාරයේ/සමාගමේ හෝ එහි මව් ව්‍යාපාරයේ/සමාගමේ වාර්ෂික පිරිවැටුම රුපියල් දස ලක්ෂ 72 ඉක්මවන වෙළෙඳ සංකීර්ණ/වෙළෙඳසැල් වැනි ආයතන සඳහා ඒවා පිහිටි ප්‍රදේශ නොසළකා දෙනු ලබන මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍රය | <br>225,000.00<br>150,000.00<br>125,000.00<br><br><br><br><br>300,000.00 | <br>25,000.00<br>25,000.00<br>25,000.00<br><br><br><br><br>25,000.00 |
| 17. | හෝටල් බලපත්‍රය (ර.බී.7) (සංචාරක මණ්ඩලය අනුමත කරනු ලැබූ)<br>1. කාමර 250 ක් හෝ ඊට වැඩි<br>2. කාමර 200 ක් හෝ ඊට වැඩි<br>3. කාමර 100 ක් හෝ ඊට වැඩි<br>4. කාමර 50 ක් හෝ ඊට වැඩි<br>5. කාමර 20 ක් හෝ ඊට වැඩි<br>6. කාමර 20 ට අඩු<br>7. සංචාරක මණ්ඩල අනුමැතිය රහිත හෝටල් කාමර 05 හෝ ඊට වැඩි | <br>375,000.00<br>300,000.00<br>150,000.00<br>125,000.00<br>110,000.00<br>100,000.00<br>100,000.00 | <br>5,000.00<br>5,000.00<br>5,000.00<br>5,000.00<br>5,000.00<br>5,000.00<br>25,000.00 |
| 18. | හෝටල් පීඨිකා බලපත්‍රය (ර.බී.8) මහ නගර සභා ප්‍රදේශ<br>වෙනත් ප්‍රදේශ<br>සහායක බලපත්‍ර | 25,000.00<br>20,000.00<br>15,000.00 | |
| 19. | අවස්ථා බලපත්‍රය (දිනකට) (ර.බී.14) (ඉල්ලුම් පත්‍ර ගාස්තු අය කරනු නොලැබේ) | 5,000.00 | |
| 20. | විකුණන වේලාවන් දීර්ඝ කිරීමට අතිරේක බලපත්‍රය (ර.බී.15)<br>මුල් පැය දෙක සඳහා පැයකට<br>ඊට වැඩිවන පැයකට<br>(ඉල්ලුම් පත්‍ර ගාස්තු අය කරනු නොලැබේ) | <br>500.00<br>5,000.00 | |
| 21. | වෙන්දේසිකරුවන්ගේ බලපත්‍රය (දිනකට) (ර.බී.16) | 5,000.00 | |
| 22. | සිනමා සඳහා විනෝද පීඨිකා බලපත්‍රය (ර.බී.9) | 75,000.00 | 25,000.00 |

| 1 වන තීරුව | | 11 තීරුව | |
|---|---|---|---|
| | බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රුපියල් | ඇපය රුපියල් |
| 23. | තානායම් බලපත්‍රය (ර. බි. 12) | 50,000.00 | 25,000.00 |
| 24. | හෝජනාගාර බලපත්‍රය (සංචාරක මණ්ඩලය අනුමත කරනු ලැබූ) (ර.බි.11)<br>හෝජනාගාර ඒ ශ්‍රේණිය<br>හෝජනාගාර බී ශ්‍රේණිය<br>හෝජනාගාර සී ශ්‍රේණිය<br>සංචාරක මණ්ඩලය අනුමැතිය රහිත හෝජනාගාර (ඉල්ලුම්පත්‍ර ගාස්තු අයකරනු ලැබේ) | <br>200,000.00<br>150,000.00<br>100,000.00<br>100,000.00 | <br>5,000.00<br>5,000.00<br>5,000.00<br>25,000.00 |
| 25. | දුම්රිය භෝජනාගාර (ර.බි.10) | 25,000,00 | 25,000.00 |
| 26. | හිමිකාර සමාජශාලා බලපත්‍රය (ර.බි. 13) | 300,000.00 | 25,000.00 |
| 27. | සාමාජිකයින් පමණක් වන සමාජශාලා (ර.බි.13ඒ)<br>සම්භාෂන හා විනෝද කාර්යයන් සඳහා පිහිටු වූ සමාජශාලා සඳහා වූ බලපත්‍රය<br>මහ නගර සභා ප්‍රදේශ<br>නගර සභා ප්‍රදේශ<br>වෙනත් ප්‍රදේශ | <br><br>75,000.00<br>50,000.00<br>25,000.00 | <br><br>25,000.00<br>25,000.00<br>25,000.00 |
| 28. | ක්‍රීඩා සමාජ<br>මහ නගර සභා<br>නගර සභා ප්‍රදේශ හා වෙනත් ප්‍රදේශ | <br>50,000.00<br>20,000.00 | |
| 29. | බියර්, ඒල්, ස්ටවුට් හා වයින් විකිණීම සඳහා විශේෂ බලපත්‍රය<br>සිල්ලරට විකිණීම (ර.බි. 22ඒ)<br>ස්ථානීය පරිභෝජනය (ර.බි.22බී) (සංචාරක මණ්ඩල අනුමැතිය සහිත හා රහිත) | <br>35,000.00<br>50,000.00 | <br>2,500.00<br>2,500.00 |
| 30. | වතු කැන්ටින් (රා පමණක්)<br>අරක්කු හා රා | 10,000.00<br>20,000.00 | 10,000.00<br>10,000.00 |
| 31. | පරිපාක ස්ප්‍රීතු විකිණීම (ර.බි.17) | 250.00 | |
| 32. | ඖෂධීය වයින් වර්ග (ර.බි.18) බලපත්‍රය | 250.00 | |
| 33. | වයින් ස්ප්‍රීතු විකිණීම | 100.00 | - |
| 34. | ඊතයිල් මධ්‍යසාර විකිණීම | 2,500.00 | 2,500.00 |
| 35. | බෝතල් කිරීමට බලපත්‍රය | 2,500.00 | |
| 36. | මීරා සඳහා (පොල්ගස්) මැදීම ගෘහස්ථ බලපත්‍රය (ගසකට) | 25.00 | |
| 37. | මීරා සඳහා (පොල්ගස්) මැදීම වාණිජ බලපත්‍රය (ගසකට) | 50.00 | |
| 38. | රා එකතු කිරීමේ ස්ථාන බලපත්‍රය | 100.00 | |
| 39. | ඖෂධීය පරිභෝජන කාර්යයන් සඳහා මැදීමට දෙන විශේෂ මහ රා බලපත්‍රය | 50.00 | |
| 40. | පැසුනු, නොපැසුනු (රා) මැදීම, නිෂ්පාදනය සහ ළඟ තබා ගැනීමට දෙන බලපත්‍රය (ගසකට) | 25.00 | |

| 1 වන තීරුව | | 11 තීරුව | |
|---|---|---|---|
| බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය | | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රුපියල් | ඇපය රුපියල් |
| 41. | තොග වශයෙන් පදම් කළ අරක්කු නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ/හෝ නිෂ්පාදනය සහ තොග වෙළෙඳසැල්වලට නිකුත් කිරීම සඳහා වන බලපත්‍රය | රු. 50,000/- අවමයකට යටත්ව දැනට පවත්නා වර්ෂයේ අගෝස්තු 31 වැනි දිනට අවසන් වන පිළිවෙලට යෙදුනු මාස දොළහක කාල පරිච්ඡේදය තුල බලපත්‍ර ස්ථානයේ අරක්කු විකිණීම/නිකුත් කිරීම පදනම මත ගණනය කොට බලපත්‍රයේ කාල පරිච්ඡේදය තුල ස්ථානයේ ඇස්තමේන්තු කල අරක්කු විකිණීම හෝ නිකුත් කිරීම තොග ලීටරයකට ශත 25 බැගිනි. | |
| 42. | තොග වශයෙන් ඉක්ෂුපාක අරක්කු නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ/හෝ නිෂ්පාදනය සහ තොග වෙළඳසැල්වලට නිකුත් කිරීම සඳහා වන බලපත්‍රය. | රු. 50,000/- අවමයකට යටත්ව දැනට පවත්නා වර්ෂයේ අගෝස්තු 31 වැනි දිනට අවසන් වන පිළිවෙලට යෙදුනු මාස දොළහක කාල පරිච්ඡේදය තුල බලපත්‍ර ලත් ස්ථානයේ අරක්කු විකිණීම/නිකුත් කිරීම පදනම මත ගණනය කොට බලපත්‍රයේ කාල පරිච්ඡේදය තුළ ස්ථානයේ ඇස්තමේන්තු කළ අරක්කු විකිණීම හෝ නිකුත් කිරීම තොග ලීටරයකට ශත 25 බැගිනි. | |
| 43. | තොග වශයෙන් තල් අරක්කු නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ/ හෝ නිෂ්පාදනය සහ තොග වෙළෙඳසැල්වලට නිකුත් කිරීම සඳහා දෙන බලපත්‍රය | රු. 50,000/- අවමයකට යටත්ව දැනට පවත්නා වර්ෂයේ අගෝස්තු 31 වැනි දිනට අවසන් වන පිළිවෙලට යෙදුනු මාස දොළහක කාල පරිච්ඡේදය තුල බලපත්‍ර ස්ථානයේ අරක්කු විකිණීමේ/නිකුත් කිරීමේ පදනම මත ගණනය කොට බලපත්‍රයේ වලංගු කාලය තුල ස්ථානයේ ඇස්තමේන්තු කල අරක්කු විකිණීම හෝ නිකුත් කිරීම තොග ලීටරයකට ශත 25 බැගිනි. | |
| 44. | තොග වශයෙන් විශේෂ අරක්කු නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ/හෝ නිෂ්පාදනය සහ තොග වෙළෙඳසැල්වලට නිකුත් කිරීම සඳහා දෙන බලපත්‍රය | රු. 50,000/- අවමයකට යටත්ව දැනට පවත්නා වර්ෂයේ අගෝස්තු 31 වැනි දිනට අවසන් වන පිළිවෙලට යෙදුනු මාස දොළහක කාල පරිච්ඡේදය තුල බලපත්‍ර ස්ථානයේ අරක්කු විකිණීම්/නිකුත් කිරීම පදනම මත ගණනය කොට බලපත්‍රයේ වලංගු කාලය තුල ස්ථානයේ ඇස්තමේන්තු කල අරක්කු විකිණීම හෝ නිකුත් කිරීම තොග ලීටරයකට ශත 25 බැගිනි. | |
| 45. | තොග වශයෙන් පොල් අරක්කු නිෂ්පාදනය සහ විකිණීම සහ/හෝ නිෂ්පාදනය සහ තොග වෙළෙඳසැල්වලට නිකුත් කිරීම සඳහා දෙන බලපත්‍රය. | රු. 50,000/- අවමයකට යටත්ව දැනට පවත්නා වර්ෂයේ අගෝස්තු 31 වැනි දිනට අවසන් වන පිළිවෙලට යෙදුනු මාස දොළහක කාල පරිච්ඡේදය තුල බලපත්‍ර ස්ථානයේ අරක්කු විකිණීමේ/නිකුත් කිරීමේ පදනම මත ගණනය කොට බලපත්‍රයේ වලංගු කාලය තුල ස්ථානයේ ඇස්තමේන්තු කල අරක්කු විකිණීම හෝ නිකුත් කිරීම තොග ලීටරයකට ශත 25 බැගිනි. | |

සටහන.-

*(අ)* අංක 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10, 11, 12, 13 සහ 14 යන අයිතමයන් යටතේ සඳහන් කර ඇති බලපත්‍ර වර්ග නිෂ්පාදනය බලපත්‍ර යටතේ සලකා කටයුතු කරනු ලැබේ.

*(ආ)* අංක 15, 16, 17, 18, 22, 23, 24, 25, 26, 27, 28, 29,හා 30 යන අයිතමයන් යටතේ සඳහන් කර ඇති බලපත්‍ර සඳහා පමණක් අයදුම් පත්‍ර ගාස්තු අය කිරීම සීමා කරනු ලැබේ.

*(ඇ)* අංක 1, 2, 3, 4, 5, 6, 8, 12, 41, 42, 43, 44 හා 45 යන අයිතමයන් යටතේ දක්වා ඇති බලපත්‍ර සඳහා බෝතල් ගත කිරීමේ බලපත්‍ර ලබා ගත යුතුය.

*(ඈ)* 2006 අප්‍රියෙල් මස 03 දිනැති අංක 1439/1 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධි විධාන) පනතට අනුව මුද්දර ගාස්තු අයකර ගත යුතු ය.

## II වන උපලේඛනය

***මත්පැන් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය***

බලපත්‍රයේ වලංගු කාලය .................සිට ....................

<table>
<tr><td colspan="4"></td><td>කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.</td></tr>
<tr><td colspan="4">ඉල්ලුම්පත<br>හැකිතාක්දුරට ඉල්ලුම්කරු විසින් සම්පූර්ණ කිරීමටː<br>(අ) නොකෙරෙනු ලබන විකල්පය කපා හැරීමෙන් හෝ (ආ) අදාල විස්තර පිරවීමෙන් හෝ (ඇ) දැනට අදාළ නොවන්නේ නම් “අදාළ නොවේ” යැයි සඳහන් කරමින් සම්පූර්ණ කිරීමට</td><td>සුරාබදු හරිවැරදි බැලීමේ ක්‍රියාවලිය<br>සුරාබදු පරීක්ෂක විසින් සම්පූර්ණ කිරීමට. හරි නම් (ලකුණු කරන්න.)</td></tr>
<tr><td colspan="4">1. සාමාන්‍ය විස්තර</td><td></td></tr>
<tr><td colspan="4">ඉල්ලුම්කරුගේ/ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ නමː-<br>..............................................<br>..............................................<br>..............................................<br>..............................................<br><br>ලිපිනයː-<br>.............................................<br>.............................................<br>.............................................<br><br>දුරකථන/ෆැක්ස්ː- ................<br><br>ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකයː- ........................<br>(අදාළ අවස්ථාවලදී)</td><td>.............................................<br><br>.............................................<br><br>.............................................<br><br>.............................................</td></tr>
<tr><td colspan="4">ජාතිය:-.............................................<br>හැඳුනුම්පත් අංකය:-...........................................<br>වයස:-...........................................<br>රැකියාව:-............................................</td><td>.............................................<br>.............................................<br>.............................................<br>.............................................</td></tr>
<tr><td colspan="4">2. බලපත්‍රයට අදාල විස්තරː-</td><td>ඉල්ලුම්කරු/සමග එකඟ නොවන්නේ නම් විස්තර දෙන්න.</td></tr>
<tr><td>බලපත්‍ර වර්ගය<br>ර.බි..........</td><td>බලපත්‍රයේ ස්වභාවය</td><td>පරිශ්‍රය පිටත</td><td>පරිශ්‍රය තුල</td><td>.............................................</td></tr>
<tr><td colspan="4">(අ) ර.බි. 7 හෝටල් බලපත්‍රයක් නම්, කාමර ගණනː-..........</td><td>.............................................</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| *(ආ)* ඉල්ලුම්කරු වෙනත් සුරාබදු බලපත්‍ර දරන්නේ ද? ඔව් නැත | | | ................................ |
| ඔව් නම් | බලපත්‍ර වර්ගය | ක්‍රියාත්මක වන පරිශ්‍රය | |
| i. | .......... | ................................ | ................................ |
| ii. | .......... | ................................ | ................................ |
| iii. | .......... | ................................ | ................................ |
| iv. | .......... | ................................ | ................................ |
| පවත්නා වර්ෂයේ නොවැම්බර් 15 වන දින වන විටත් මෙම ස්ථානයේ මත්පැන් බලපත්‍රයක් ක්‍රියාත්මක වී ඇද්ද? ඔව් නැත<br>ඔව් නම්,<br>I. බලපත්‍රධාරියාගේ නම සහ ලිපිනයඃ- ....................<br>(ඉහත සඳහනට වෙනස් නම්)ඃ- ....................<br>..............................................<br>..............................................<br>..............................................<br>..............................................<br>..............................................<br>II. මෙම පරිශ්‍රයට අදාළව බලපත්‍රය ක්‍රියාත්මකව තිබූ මුළු කාලයඃ-<br>....................<br>III. බලපත්‍රය ආරම්භ වූ වර්ෂයඃ-............................ | | | ................................<br>................................<br>.<br>..............................<br>................................ |
| *3. ඉල්ලුම්කරු බලපත්‍රය ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන පරිශ්‍රයේ භූගෝලීය පිහිටීමඃ* | | | *ඉල්ලුම්කරු සමග එකඟ නොවන්නේ නම් විස්තර දෙන්න.* |
| තැපැල් ලිපිනයඃ- ..............................................<br>..............................................<br>.............................................. | | | .............................................. |

| | |
|---|---|
| දිස්ත්‍රික්කයඃ- ................................ | ................................ |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයඃ- ................................ | ................................ |
| පොලිස් වසමඃ- ................................ | ................................ |
| මැතිවරණ කොට්ඨාශයඃ- ................................ | ................................ |
| සුරාබදු පරිශ්‍රයඃ- ................................ | ................................ |

| | | | | |
|---|---|---|---|---|
| 4. *පිහිටීම අනුව පරිශ්‍රයේ සුදුසුභාවයඃ-* | | | | *ඉල්ලුම්කරු සමග එකඟ නොවන්නේ නම් විස්තර දෙන්න.* |
| *(අ)* බලපත්‍ර වර්ගයට නියමිත දුර ප්‍රමාණයට වඩා පහත සඳහන් ස්ථානවලට ඇති දුර ප්‍රමාණය වැඩි වන්නේ ද? | පොදු පූජනීය පරිශ්‍රයක් | ඔව් | නැත | ................................ |
| | පාසැල් | ඔව් | නැත | ................................ . |
| සිල්ලරට පිටත විකිණීමඃ- මීටර් 100<br><br>ස්ථානයේ පරිභෝජනය සඳහාඃ- මීටර් 500 | 1 වන ඇමුණුම ලෙස, බලපත්‍ර ලත් මිනින්දෝරුවෙකුගේ මිණුම් පිඹුරක් අමුණන්න. | | | ................................ |
| *(ආ)* පරිශ්‍රය පිහිටා ඇත්තේ රටබීම තැබෑරුම් ප්‍රදේශයක් ඇතුල ද?<br><br>*(ඇ)* "ඔව්" නම්, ළඟම ඇති තැබෑරුමේ සිට ඇති දුරඃ-.................................... | | ඔව් | නැත | ..............................................<br><br>........ |
| *(ඈ)* සමාජශාලා බලපත්‍ර දරන්නන් සඳහා අදාළ නම් පමණක් සම්පූර්ණ කරන්න. | (I) ඔබ 1975 අංක 17 දරන සමාජශාලා පනත යටතේ ලියාපදිංචි වී ඇත්තේ ද? | ඔව් | නැත | .............................................. |
| | (II) ඔබ ක්‍රීඩා අමාත්‍යාංශය/ සමාජසේවා අමාත්‍යාංශය සමග ලියාපදිංචි වී ඇත්තේ ද? | ඔව් | නැත | .............................................. |
| | (III) පසුගිය වර්ෂ 5 තුල සක්‍රියව ක්‍රියාත්මකවී ඇත්තේ ද? | ඔව් | නැත | .............................................. |
| | (IV) ඔබ බැංකු ගිණුමක් දරන්නේ ද? | ඔව් | නැත | .............................................. |
| 5. සාපරාධී අපරාධඃ- | | | | |
| *(අ)* සාපරාධී අපරාධ කිසිවක් සඳහා ඔබ වරදකරු වී තිබේද? | | ඔව් | නැත | .............................................. |

| | | | |
|---|---|---|---|
| *(ආ)* සුරාබදු අපරාධ කිසිවක් සඳහා ඔබ වරදකරු වීද? තිබේ ද? | ඔව් | නැත | ................................ |
| *(ඉ)* ඉහත සඳහන් කිසිවක් සම්බන්ධයෙන් “ඔව්” යන්නෙන් පිළිතුරු සපයා ඇත්නම්, | | | 2 වන ඇමුණුමෙහි විස්තර සපයන්න. |
| පසුගිය වර්ෂ 3 ක් තුලදී ඔබට කාර්මික අපරාධ වාර්තා ඉදිරිපත් කර තිබේද? “ඔව්” නම් විස්තර සපයන්න. | ඔව් | නැත | ................................ |

| වර්ෂය | කාර්මික අපරාධ වාර්තා අංකය | ගෙවූ දඩය |
|---|---|---|
| | | |
| | | |

| | | | |
|---|---|---|---|
| 6. අයිති බවට ඇති සාක්ෂි, පාවිච්චිය සඳහා අනුමැතිය සහ පරිශ්‍රය පිළිබඳ විස්තරඃ- | | | ඉල්ලුම්කරු සමග එකඟ නොවන්නේ නම් විස්තර දෙන්න. |
| *(අ)* අයිතියේ ස්වභාවයඃ- | අයිති | කුලියට | ................................ |
| ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු විසින් සහතික කල ලියාපදිංචිකළ ඔප්පුවේ/කුලීබදු ගිවිසුමේ පිටපතක් අමුණන්න. ඇමුණුම 03 | | | ................................ |
| *(ආ)* අයිතිය පිළිබඳ ආරවුලක් තිබේ ද? 'ඔව්' නම් 4 වන ඇමුණුමේ විස්තර සපයන්න. ඇමුණුම 04 | ඔව් | නැත | ................................ |
| *(ඇ)* කුලියට නම්, අයිතිකරු විසින් බලපත්‍රය පවත්වා ගෙන යාමට පරිශ්‍රය අනුමත කර ඇත් ද? | ඔව් | නැත | .............................. |
| 'ඔව්' නම්, 5 වන ඇමුණුමෙහි ලෙස, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු සහතික කළ අනුමැතිය අමුණන්න. | | | ................................ |
| *(ඈ)* යෝජිත පරිශ්‍රය, ගොඩනැගිල්ලේ කුමණ ස්ථානයක පිහිටියේ ද? | සම්පූර්ණ ගොඩනැගිල්ල | ගොඩනැගිල්ලේ කොටසක/මහලක | ................................ |
| ගොඩනැගිල්ලේ කොටසක නම්, අනිකුත් තැන් පාවිච්චි කරනුයේ කුමන දෙයකටදැයි දක්වමින්, මුළු සැලැස්මේ කටු සටහනක් 6 වන ඇමුණුම ලෙස අමුණන්න. | | | .............................................. |

| | | |
|---|---|---|
| *(ඉ)* බලපත්‍ර පරිශ්‍රයේ මායිම්:- | උතුරටඃ- .................................................. | .............................................. |
| | දකුණටඃ- .................................................. | .............................................. |
| | බටහිරටඃ- .................................................. | .............................................. |
| | නැගෙනහිරටඃ- .................................................. | .............................................. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) ගොඩනැගිල්ලේ විස්තරය (අදාළ නොවේ නම් කපා හරින්න. | බිම<br>වහල<br><br>බිත්ති | සිමෙන්ති<br>ඇස්බෙස්ටොස්<br><br>ගඩොල් සහ බදාම | ටයිල්<br>උළු<br><br>පුවරු | වෙනත්<br>වෙනත්<br><br>වෙනත් | ..............................<br>..............................<br>.............................. |
| ඇමුණුම 7 ලෙස සහතික කරන ලද කටුසටහනක් අමුණන්න. | දොරවල්, ජනෙල් සහ වෙනත් වාතාශ්‍රය ලැබීම් පිළිබඳ විස්තර කරන්න.<br>..........................................<br>..........................................<br>වෙනත් ඒවා නම්, 8 වන ඇමුණුමෙහි විස්තර දෙන්න. | | | | ගොඩනැගිල්ල සෑම අතින්ම සුදුසුදැයි අදහස් දක්වන්න. |
| (උ) ගොඩනැගිල්ලේ වරිපනම් අංකයඃ-<br>අංකය නොමැති නම්, 9 වන ඇමුණුමෙහි විස්තරඃ-........................... | | | | | .............................. |
| මෙම ඉල්ලුම්පත ඉදිරිපත් කිරීමෙන් පමණක් මට/අපට බලපත්‍රය හිමි නොවන බව සහ ඉහත සඳහන් විස්තර අසත්‍ය බවට සොයා ගත් ඕනෑම අවස්ථාවක හෝ සුරාබදු ආඥාපනත යටතේ දැනට බලාත්මක රීති, නියෝග සහ නිවේදන හෝ එකී පනත යටතේ ඉදිරියේදී පනවනු ලැබිය හැකි රීති සහ නියෝග සහ කඩ කිරීමක් සිදුකළේ නම්, සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ නියෝගයෙන් බලපත්‍රය අත්හිටුවීම<br>හෝ<br>අවලංගු කිරීම කළහැකි බවද, සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන බව ද, බලපත්‍රයක් නිකුත් නොකිරීමෙන් ශ්‍රී ලංකා රජයෙන් හෝ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් කටයුතු කරන නිලධාරියෙකුගෙන් වන්දි ඉල්ලා සිටීමට මට/අපට හිමිකමක් නොමැති බව ද, මම/අපි දන්නා බව ප්‍රකාශ කර සහතික කරමි./කරමු.<br><br>ඉල්ලුම්කරුගේ/ඉල්ලුම්කරුවන්ගේ අත්සන.<br>දිනයඃ- | | | | | සුරාබදු පරීක්ෂකගේ සාමාන්‍ය නිරීක්ෂණඃ-<br>..............................<br>..............................<br>..............................<br>..............................<br><br>..............................<br>සුරාබදු පරීක්ෂකගේ අත්සන.<br><br>දිනයඃ- .................... |

ඉල්ලුම් පත්‍රයට අදාල I, II, III, IV, V, VI, VII, VIII, IX ඇමුණුම්

ඉල්ලුම්කරු/ ඉල්ලුම්කරුවන් විසින් සම්පූර්ණ කළ යුතු ය

| ඉල්ලුම්කරු/ ඉල්ලුම්කරුවන් විසින් සම්පූර්ණ කළ යුතුය. | | කාර්යාලීය ප්‍රායෝජනය සඳහා පමණී. සුරාබදු පරීක්ෂක විසින් සම්පූර්ණ කළ යුතුය. |
|---|---|---|
| 1 වන ඇමුණුම පරිශ්‍රයේ පිහිටීමේ සුදුසුභාවය | | |
| ළගම ඇති පූජනීය ස්ථානය සහ පාසලට ඇති දුර ප්‍රමාණයන් දක්වමින්, බලපත්‍රලත් මිනුම්දෝරුවෙකුගෙන් ලබා ගත් මිනුම්දෝරු සැලැස්මක පිටපතක් අමුණා ඇත. | | |
| සාපරාධී අපරාධ | | |
| 2 වන ඇමුණුම | යෝජිත ස්ථානයේ සිදු කරන ලද සුරාබදු වරදවල් හෝ /සහ සුරබදු හෝ සාපරාධි වරදවල් පිළිබඳව උසාවිය මගින් වදරකරු කිරීමක් කළේ නම්, එහි විස්තර පහත දක්වන්න.<br>1.…………………<br>2.…………………<br>3.…………………<br>4.…………………<br>5.…………………<br>6.………………… | …………………<br>…………………<br>…………………<br>…………………<br>………………… |
| අ කොටස | පසුගිය වර්ෂ තුන තුලදී දඩ මුදල් සහ ග්‍රහණයන් පිළිබඳ විස්තර ඇතුළත්ව අදාළ සහකාර සුරාබදු කොමසාරිස් /සුරාබදු අධිකාරීගේ වාර්තාව | |
| ආ කොටස | ඉල්ලුම්කරු, තමා දණ්ඩ නීති සංග්‍රහය යටතේ වන වරදකට හෝ චරිත දූෂණයකට සම්බන්ධ වරදකට ගෙවී ගිය වසර 5තුළ වරදකරුවකු නොවූ බවට දිවුරුම් පෙත්සමකින් කරන ලද ප්‍රකාශයක් | |
| ඇ කොටස | ඉල්ලුම්කරු / පසුගිය වර්ෂ (5) කාලය තුළදි අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය යටතේ හෝ සුරාබදු ආඥාපනත යටතේ වරදකරුවකු වී නොමැති බවට බලපත්‍ර පරිශ්‍රය පිහිටි ප්‍රදේශයේ ඉල්ලුම්කරු ඒ කියන බලපත්‍රය දැරීමට සුදුසු වූවත්, නිසි වූවත්, පුද්ගලයෙකු සහ එම බලපත්‍රය නිකුත් කිරීම සඳහා මහජනයාගේ විරුද්ධතාවක් නොමැති බවට බලපත්‍ර පරිශ්‍රය පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වාර්තාවක්. | |
| පරිශ්‍රය අයිති බවට සාක්ෂි, පාවිච්චිය සඳහා අනුමතය සහ පරිශ්‍රයේ විස්තර | | |
| 3 වන ඇමුණුම | ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු විසින් සහතික කළ, ලියාපදිංචි කළ ඔප්පුවේ /කුලිය / බදු ගිවිසුමේ පිටපත | |
| 4 වන ඇමුණුම | අයිතියට අදාල ආරවුල්<br>යෝජිත පාර්ශවයේ ගොඩනැගිල්ලේ අයිතිය සම්බන්ධව ආරවුලක් ඇත්නම් හෝ ගොඩනැගිල්ලට විරුද්ධව උසාවි නියෝගයක් ඇත්නම්, ඒවායෙහි විස්තර<br>…………………<br>…………………<br>…………………<br>………………… | |

| | | |
|---|---|---|
| 5 වන ඇමුණුම | කුලියටගත් පරිශ්‍රයක් වූ අවස්ථාවක අනුමත ගොඩනැගිල්ල කුලියට හෝ බද්දට ගෙන තිබේ නම්, ව්‍යාපාරය අවහිරයකින් තොරව පවත්වාගෙන යාමට ඉඩ දෙන බවට අයිතිකරු සමග ඇති කර ගත් ප්‍රසිද්ධ නොතාරිස් තැනක විසින් සහතික කළ ගිවිසුමක් | |
| 6 වන ඇමුණුම | ගොඩනැගිල්ලේ කොටසක් පමණක් භාවිතා කරන අවස්ථාවක ගොඩනැගිල්ලේ කොටසක් නම්, අනිකුත් කොටස් පාවිච්චි කරනුයේ කුමණ දෙයකටදැයි සඳහන් කරමින් සම්පූර්ණ සැලැස්මේ කටුසටහනක් අමුණන්න. | |
| 7 වන ඇමුණුම | භාවිතා කිරීමට යෝජිත ගොඩනැගිල්ලේ දල කටු සටහනක් ලෙස භාවිතා කිරීමට යෝජිත ගොඩනැගිල්ලේ සහතික කළ දළ කටු සටහනක් අමුණන්න | |
| 8 වන ඇමුණුම | ගොඩනැගිල්ලට භාවිතා කර ඇති ද්‍රව්‍යවල විස්තර බිත්තිය, වහල ආදිය ආකෘතියේ සඳහන් කර නොමැතිදැයින් තනා ඇත්නම්, විස්තර දෙන්න.<br>…………………<br>…………………<br>…………………<br>………………… | |
| 9 වන ඇමුණුම | පරිශ්‍රයට වරිපනම් අංකයක් දී නොමැති නම් වරිපනම් අංකයක් නොමැති නම්, යාබද ගොඩනැගිලිවල අංක සඳහන් කරන්න. ඒවාද ලබා ගත නොහැකි නම්, යාබද ඉඩමේ / ඉඩම්වල නම් සඳහන් කරන්න.<br>…………………<br>…………………<br>…………………<br>………………… | |
| | වෙනත් අවශ්‍යතාවයන් -<br>(අ) ප්‍රාදේශීය අධිකාරීන් විසින් සහතික කරන ලද බිම් සැලැස්ම (රබී 22 ඒ බලපත්‍රවලට අදාල නොවේ). | |
| | (ආ) ඉල්ලුම්පත් ගාස්තුව ගෙවීම සනාථ කරන ලදුපතේ ඡායාස්ථික පිටපතක් සහ ලදුපතේ අංකය හා දිනය (ලදුපත ඉල්ලුම්කරුගේ නමට නිකුත් වී තිබිය යුතුය). | |
| | (ඇ) ආදායම් බදු, එකතු කළ අගය මත බදු ( අදාළ නම් ) හා අනෙකුත් අදාළ බදු ගෙවූ බවට සනාථ කරන ලදුපත්වල ඡායස්ථි පිටපතක් (ලදුපත ඉල්ලුම්කරුගේ නමට නිකුත් වී තිබියි යුතුය). | |

**නිරීක්ෂණයන් හා සාමාන්‍ය නිර්දේශ**

| |
|---|
| 1. සුරාබදු ස්ථානයේ ස්ථානාධිපති විසින් පිරවිය යුතු ය.<br><br>ගොඩනැගිල්ලේ සාමාන්‍ය යෝග්‍යතාවය සහ සුරාබදු අවශ්‍යතා අනුව ගොඩනැගිල්ලට කළ යුතු වෙනස් කම් සම්බන්ධ නිර්දේශ:-<br>අත්සන :<br>නම :<br>දිනය :<br>මුද්‍රාව : |
| 2. *ස්ථාන භාර සුරාබදු නිලධාරි* :<br><br>අත්සන :<br>නම :<br>දිනය :<br>මුද්‍රාව : |
| 3. *සුරාබදු අධිකාරී* :<br><br>අත්සන :<br>නම :<br>දිනය :<br>මුද්‍රාව : |

III වන උපලේඛනය

*සුරාබදු බලපත්‍ර නිකුත් කිරීමට අදාළ වන මාර්ගෝපදේශ සහ කොන්දේසි*

1. (අ) දැනට දරන්නන්ගේ බලපත්‍ර ස්වයංක්‍රීයව අළුත්වීමට හිමිකම් නොලබයි. බලපත්‍රය වලංගු කාලය අවසන් වන විට, එකී බලපත්‍රලාභියා එම බලපත්‍රය තවදුරටත් දීර්ඝ කිරීමට අදහස් කරන්නේ නම්, ඔහු විසින් බලපත්‍රය අවලංගු වන දිනට යටත් පිරිසෙයින් දින පහළොවකට (15) පෙරාතුව ඉල්ලුම් පත්‍රය මෙම මාර්ගෝපදේශ හා කොන්දේසිවලට අනුව ඉදිරිපත් කළ යුතුය.

   (ආ) එසේ ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් මෙම මාර්ගෝපදේශ හා කොන්දේසිවලට අනුවද, සුරාබදු ආඥා පනතේ දක්වා ඇති වෙනත් යම් නියමයන්වලට අනුවද, සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් සලකා බලනු ඇත.

2. (II වන උපලේඛනයේ දක්වා ඇති ඉල්ලුම්පත්‍ර අදාළ ඉල්ලුම්පත්‍ර ගාස්තුව ගෙවීමෙන් අනතුරුව, සුරාබදු ප්‍රධාන කාර්යාලයෙන් හෝ දිවයින පුරා පිහිටා ඇති සහකාර සුරාබදු කොමසාරිස් කාර්යාලවලින් හෝ ලබා ගත යුතුය. කෙසේ වුවද ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීම, ඉල්ලුම්කරුට බලපත්‍රයක් නිකුත් කරන බවට සහතිකයක් නොවේ.

3. ඉල්ලුම්පත් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ විය යුතු අතර, අවශ්‍ය සියළු ලේඛන අමුණා තිබිය යුතුය. අසම්පූර්ණ හෝ අවශ්‍ය ලේඛන නොමැතිව ඉදිරිපත් කරන ලද මාර්ගෝපදේශ හෝ කොන්දේසිවලට අනුකූල නොවන හෝ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. II වන උපලේඛනයේ දක්වා ඇති ආකාරයට සකසන ලද ඉල්ලුම්පත් සම්පූර්ණ කර, බලපත්‍ර ස්ථානය පිහිටා ඇති ස්ථානයකට අදාළ සහකාර සුරාබදු කොමසාරිස් අමතා ලේඛනගත තැපෑලෙන් අදාළ සහකාර සුරාබදු කොමසාරිස් කාර්යාලය වෙත යැවිය යුතුය.

5. අලුත් බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන විට හෝ බලපත්‍ර දරන්නකු තම බලපත්‍රය අලුත්කිරීම සඳහා ඉල්ලුම් කරන විට හෝ ප්‍රතිපූර්ණය කරනු නොලබන රුපියල් 7,500 ක ඉල්ලුම්පත්‍ර ගාස්තුවක් ගෙවිය යුතුය.

6. වලංගු කාලය අවුරුද්දක් පමණක් වන සංචාරක මණ්ඩල අනුමතය සහිත ආපන ශාලා/ සංචාරක මණ්ඩල අනුමතය සහිත හෝටල් සඳහා නිකුත් කරන බලපත්‍ර හැර, අනෙකුත් බලපත්‍ර මුදල් වර්ෂ 03 ක කාලයක් සඳහා නිකුත් කරනු ලැබේ. වර්ෂය මැද අලුතින් නිකුත් කරනු ලබන සංචාරක මණ්ඩලය අනුමතය සහිත ආපනශාලා / සංචාරක මණ්ඩල අනුමතය සහිත හෝටල් සඳහා වූ බලපත්‍ර අවුරුද්දේ ඉතිරි කාලයට පමණක් නිකුත් කරනු ලබන අතර, අවුරුද්ද මැද නිකුත් කරනුලබන අනෙකුත් අලුත් බලපත්‍ර එම වර්ෂයේ ඉතිරි කාලය සඳහා ද, ඊළඟ මුදල් වර්ෂ දෙකක කාලය සඳහා ද නිකුත් කරනු ලැබේ.

7. සුරාබදු ආඥාපනත යටතේ සාර්ථක ඉල්ලුම්කරුවන්ට නිකුත් කරනු ලබන සියලු බලපත්‍ර වෙනුවෙන් මෙම රීතිවල 1 වන උපලේඛනයේ දක්වා ඇති පරිදි වූ බලපත්‍ර ගාස්තු ගෙවිය යුතුය. වර්ෂය මැද දී නිකුත් කරනු ලබන අලුත් බලපත්‍ර සම්බන්ධයෙන්, අදාළ කාලයට ප්‍රමාණුකූල ලෙස බලපත්‍ර ගාස්තු අය කරනු ලැබේ බලපත්‍රයක්, අවුරුදු තුනක් සඳහා නිකුත් කරනු ලැබුව ද, බලපත්‍ර ගාස්තු වාර්ෂිකව ගෙවිය හැකි ය. අදාළ මුදල් වර්ෂය ආරම්භවීමට යටත් පිරිසෙයින් දින හතකට පෙරාතුව එම වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තු ගෙවිය යුතුය. එසේ වුවද, අදාළ මුදල් වර්ෂය ආරම්භ වී වැඩ කරන දින හතක් ඇතුළත, ප්‍රාදේශීය ලේකම් වෙත බලපත්‍ර ගාස්තු නොගෙවන බලපත්‍ර දරන්නකු විසින් බලපත්‍ර ගාස්තුවට අමතරව බලපත්‍ර ගාස්තුවෙන් 1% ක ප්‍රමාද ගාස්තුවක් ගෙවා අදාළ වර්ෂයේ මුල් සති හතරක් ඇතුළත තම බලපත්‍රය ලබාගත හැකි ය. ඉන් පසුව 3% ක ප්‍රමාද ගාස්තුවක් අයකරනු ලැබේ. අදාල මුදල් වර්ෂයට බලපත්‍ර ගාස්තු ගෙවනු ලබන තෙක්, බලපත්‍රය ක්‍රියාත්මක කිරීමට ඉඩ දෙනු නොලැබේ.

8. බලපත්‍ර ගාස්තුවට අමතරව, මෙහි I වන උපලේඛනයේ II තීරයේ දක්වා ඇති පරිදි, එක් එක් වර්ගය සම්බන්ධයෙන් ඇප තැන්පතුවක් ගෙවිය යුතුය. ආඥාපනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලබන සෑම තැනැත්තකුම බලපත්‍රයේ කාලය ආවරණය කිරීම සඳහා ප්‍රතිරූප ගිවිසුමකට ඇතුළත් විය යුතුය. ප්‍රතිරූප ගිවිසුම යථා පරිදි, ඉටුකිරීම සඳහා ඇප තැන්පතුව අවශ්‍ය වේ.

9. ඉල්ලුම්කරුට මත්පැන් බලපත්‍රයක් ප්‍රදානය කිරීම සුරාබදු කොමසාරිස් ජනරාල් වරයා විසින් ප්‍රතික්ෂේප කරන්නේ නම්, එවැනි අදහසක් දැරීමට ඔහුට ඇති හේතුන්, ඉල්ලුම්පත ලැබී දින 30ක් ඇතුළත දී ලියාපදිංචි තැපෑලෙන් ඉල්ලුම්කරුට දැනුම් දිය යුතු අතර, තමන්ට බලපත්‍රයක්දීම යුක්ති සහගත යැයි දැක්වීමට හේතු ඉල්ලුම්කරුට ඇත්නම්, එම හේතුන් දක්වන ලෙසට ඔහුට දැන්විය යුතුය. ඒ අනුව සුරාබදු කොමාසාරිස් ජනරාල්ගේ දැන්වීම ලැබී සති දෙකක් ඇතුළත, තමන් ඉදිරිපත් කරන කරුණු තහවුරු කිරීමට ලේඛන ඇත්නම්, ඒවා ද ඉදිරිපත් කරමින් සුරාබදු කොමසාරිස් ජනරාල් දැක්වූ හේතුවලට විරුද්ධව හේතුන් ලිඛිතව, ලියාපදිංචි තැපැලෙන් ඔහු අමතා දැක්විය යුතුය.

10. සුරාබදු කොමසාරිස් ජනරාල් ඉන් පසුව, සහ ඉල්ලුම්කරුගෙන් පිළිතුරු ලිපියක් ලැබුණු දිනෙන්, දින 30කට ප්‍රමාද නොවන සේ සියලු කරුණු සලකා බලා ඔහුට අවස්ථානුකූලයයි හැඟෙන පරිදි පරීක්ෂණයක් පවත්වා, අයදුම්කරුට මත්පැන් බලපත්‍රයක් නිකුත් කළ යුතු ද ? යන්න තීරණය කිරීම හෝ එවැනි බලපත්‍රයක් ප්‍රතික්ෂේප කිරීම සනාථ කිරීම කළ යුතුය. එසේ ගත් තීරණය වහාම ලිඛිතව ලියාපදිංචි තැපැලෙන් ඉල්ලුම්කරුට දැන්විය යුතුය.

11. එක් පළාතක් සම්බන්ධයෙන් නිකුත් කළ යුතු පහත සඳහන් වර්ගවලට අයත් බලපත්‍ර සංඛ්‍යාව තීරණය කරනු ලබන්නේ ජනගහණ තත්ත්වය, මත්පැන් පාරිභෝජන රටාව හා වෙනත් සාමාජීය අවශ්‍යතා අනුවය එක් එක් පළාත සම්බන්ධයෙන් දැනට නිකුත් කළ යුතු බලපත්‍ර සංඛ්‍යාව පහත දැක්වෙන පරිදි වේ.

| *පළාත* | *මත්පැන් සිල්ලර විකිණීමේ බලපත්‍ර සංඛ්‍යාව (රබ් 04)* | *සංචාරක මණ්ඩල අනුමැතිය රහිත හෝටල් සංඛ්‍යාව (රබ් 07)* | *සංචාරක මණ්ඩල අනුමැතිය රහිත ආපනශාලා (රබ් 11)* |
|---|---|---|---|
| බස්නාහිර | 312 | 8 | 146 |
| දකුණ | 104 | - | 22 |
| උතුර | 54 | 3 | 21 |
| නැගෙනහිර | 61 | 7 | 16 |
| මධ්‍යම | 223 | 8 | 49 |
| උතුරුමැද | 65 | 4 | 16 |
| වයඹ | 106 | - | 39 |
| ඌව | 76 | 4 | 24 |
| සබරගමුව | 103 | - | 29 |
| එකතුව | 1,104 | 34 | 362 |

සැ. යු.- ඉහත ඡේදයේ සඳහන් සීමාකිරීම් තම සමාගමේ / ව්‍යාපාරයේ හෝ මව් සමාගමේ / ව්‍යාපාරයේ වාර්ෂික පිරිවැටුම් රුපියල් දශ ලක්ෂ 72 ඉක්මවන වෙළඳ සංකීර්ණ/ වෙළඳසැල් වැනි ආයතනයන්ට ලබාදෙන මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍ර (රබ් 04) සම්බන්ධයෙන් අදාළ නොවේ.

12. ඉල්ලුම්පත් සමග පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කිරීමට නව හා දැනට බලපත්‍ර දරන ඉල්ලුම්කරුවන්ට නියම කරනු ලැබේ. කෙසේ වෙතත්, සුරාබදු කොමසාරිස් ජනරාල්ට ඕනෑම ඉල්ලුම්කරුවකුට අදාළ වන ඕනෑම තොරතුරක් සුරාබදු දෙපාර්තමේන්තුවේ ඇති ඕනෑම ලිපි ගොනුවක් බලා උපුටා ගැනීමට හෝ ඉල්ලුම් කර ඇති බලපත්‍රය නිකුත් කිරීම ගැන සලකා බැලීම සඳහා ඉල්ලුම්කරුගේ අදායම් බදු හෝ වෙනත් බදු ගෙවන ලද විස්තර ඇතුළුව අවශ්‍ය ඕනෑම තොරතුරක් ඉල්ලා ගෙන්වා ගැනීමේ අයිතිය ඇත්තේ ය

13. අලුත් ඉල්ලුම්කරුවන් සම්බන්ධයෙන් අවශ්‍ය වාර්තා හා ලිපි ලේඛන -

(අ) පළාත් පාලන බලධාරින් විසින් සහතික කරන ලද (ගෙබිම ප්‍රමාණයේ විස්තර ඇතුළුව) යෝජිත ගොඩනැගිල්ලේ පිඹුරෙහි ඡායාස්ථි පිටපතක්

(ආ) ඉල්ලුම්කරු සහතික පිටපත් සමග මුල් ලියකියවිලි ඔප්පු සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරමින් අයිතිවාසිකම් ඔප්පු කළ යුතුය. සහතික පිටපත් මේ කාර්ය සඳහා පවත්වා ගෙන යනු ලබන ගොනුවේ තබා ගනු ලැබේ. ස්ථානය ඉල්ලුම්කරුට අයත් නොමැති නම්, යෝජිත ව්‍යාපාරය නිරවුල්ව එම ස්ථානයේ කරගෙන යා හැකි බවට අයිතිකරුගේ කැමැත්ත ප්‍රකාශ කරන ලියකියවිල්ලක් ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු විසින් නියම අයුරින් සහතික කර ඉදිරිපත් කළ යුතුය. යෝජිත ස්ථානය උකස් කොට ඇති විටක දී, අදාළ මූල්‍ය ආයතනයෙන් ඒ බව සනාථ කෙරෙන ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

(ඇ) සුරාබදු ස්ථානාධිපති, සුරාබදු අධිකාරි හා සහකාර සුරාබදු කොමසාරිස්වරයාගේ නිර්දේශ ඇතුළත් වාර්තාව (II වන උපලේඛනය අනුව )

(ඈ) ඉල්ලුම්කරු පසුගිය වර්ෂ පහක කාලය තුළදී, දණ්ඩ නීති සංග්‍රහය යටතේ හෝ චරිතයට අදාළ වෙනත් වරදක් හෝ සම්බන්ධයෙන් වරදකරුවකු වී නොමැති බවට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

(ඉ) මේ සම්බන්ධයෙන් ඊට විරුද්ධ යම් පැමිණිල්ලක් ලැබුණ හොත්, මෙහි 21 වන ඡේදයේ දක්වා ඇති පරිදි සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ලබන පරීක්ෂණයකින් අනතුරුව බලපත්‍රයක් ලබාදීම, ප්‍රතික්ෂේප කිරීම හෝ පවතින බලපත්‍රය අවලංගු කිරීම හෝ කල යුතු ය.

(ඊ) ඉල්ලුම්කරු පසුගිය අවුරුදු පහක (05) කාලය තුළදී දණ්ඩ නීති සංග්‍රහය යටතේ හෝ සුරාබදු ආඥාපනත යටතේ වරදකට වරදකරුවකු වී නොමැති බවට බලපත්‍රලත් පරිශ්‍රය පිහිටා ඇති ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයාගෙන් ලබාගත් වාර්තාවක් සහ ඉල්ලුම්කරු එම බලපත්‍රය දැරීමට සුදුසු තැනැත්තකු බවත් එම බලපත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් මහජනයාගේ විරුද්ධත්වයක් නොමැති බවට බලපත්‍ර පරිශ්‍රය පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

(උ) යෝජිත ගොඩනැගිල්ලේ සිට ළඟම ඇති පාසල් හා ප්‍රසිද්ධ පූජනීය ස්ථානවලට දුර ප්‍රමාණයන් (මායිමෙන් මායිමට කෙළින් ගිය විට ඇති දුර ප්‍රමාණයන් ) දක්වන බලයලත් මිනින්දෝරුවෙකුගෙන් ලබාගත් මිනින්දෝරු සැලැස්මක්.

(ඌ) පාසැල් හා ප්‍රසිද්ධ පූජනීය ස්ථානවලට තිබිය යුතු දුර නිශ්චිත දුර ප්‍රමාණ කඩකර ඇති බවට යම් පැමිණිල්ලක් ලැබුණහොත්, රජයේ මිනින්දෝරු අධිකාරීගෙන් මැණුම් වාර්තාවක් ලබාගෙන සත්‍ය දුර ප්‍රමාණයන් නිර්ණය කර ගත යුතුය. එවැනි අවස්ථාවක් පැන නැගුනහොත්, මැනුම් ගාස්තු බලපත්‍රධාරී විසින් දැරිය යුතු ය. එහිදී, දුර ප්‍රමාණ පිළිබඳ නීති උල්ලංඝනය වී ඇති බවට අනාවරණය වුවහොත්, බලපත්‍රය අවලංගු කරනු ලැබේ.

(එ) 1987 අංක 7 දරන ව්‍යාපාර නාම පනත අනුව, ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය හා සමාගමක් සම්බන්ධයෙන් නම්, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු මගින් සහතික කළ සමාගම් ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

(ඒ) ප්‍රතිපූරණය කරනු නොලබන ඉල්ලුම් පත්‍ර ගාස්තුව ගෙවූ බවට සාක්ෂි.

14. වෙළෙඳ සංකීර්ණ / වෙළඳසැල් වැනි ආයතන සඳහා දෙනු ලබන මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍ර සම්බන්ධයෙන් තම මව් ව්‍යාපාරයේ / සමාගමේ පසුගිය වර්ෂය සඳහා වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 72ක් ඉක්මවූ බවට පිළිගත් විගණන සමාගමක වාර්තාවක් මගින් හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ සහතිකයක් මගින් සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

15. ඉල්ලුම්කරුවන් විසින්, සමාජශාලා බලපත්‍ර සම්බන්ධයෙන්, ඉහත සඳහන් ලේඛණ සහ වාර්තාවලට අමතරව පහත සඳහන් වාර්තා ද ඉදිරිපත් කළ යුතුය.

(අ) 1975 අංක 17 දරන සමාජ ශාලා පනත යටතේ ලියාපදිංචි සහතිකය;

(ආ) ඉල්ලුම්පත ඉදිරිපත් කළ දිනට වහාම පෙරාතුව වූ අවුරුදු පහ (5) තුළ සමාජශාලාව නොකඩවා පැවති බව සනාථ කිරීමට ලේඛන (දැනට බලපත්‍ර දරන්නන්ට මෙම කොන්දේසිය අදාළ නොවේ)

(ඇ) බැංකු ගිණුමක් පවත්වාගෙන යන බවට සාක්ෂි ;

(ඈ) ක්‍රීඩා අමාත්‍යාංශයේ /සමාජ සේවා අමාත්‍යාංශයේ ලියාපදිංචි සහතිකයක් ;

16. මෙහි I වන උපලේඛනයේ දක්වා ඇති වාර්ෂික බලපත්‍ර ගාස්තුව ගෙවීම ද, ඇතුළුව එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනට පෙරාතුව අදාල මාසික ගෙවීම ද ඇතුළුව කාර්තු හතර සම්බන්ධයෙන් (බලපත්‍ර වලංගු කාලය තුළ ) වාර්ෂික පදනමක් මත ආදායම් බදු එකතු කළ අගය මත බදු(අදාළ අවස්ථාවලදී ) ගෙවීම පිළිබඳ සාක්ෂි.

17. එම තොරතුරු ඉදිරිපත් කිරීමට බලපත්‍ර දරන්නකු අපොහොසත් වන අවස්ථාවක, භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ඇතිව එම බලපත්‍රය අවලංගු කිරීමට සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කළ යුතුය.

18. බියර්, ඒල්, ස්ටවුට් හා (රබ් 22 ඒ ) වයින් වර්ග විකිණීම සඳහා බලපත්‍ර ලබාගැනීමට අළුතින් ඉල්ලුම් කරන්නන් ඉහත 13 (1) ඡේදයේ (අ), (ආ), (ඇ), (ඈ), (ඊ), (උ), (ඒ), (ඒ) උපඡේදවල සඳහන් ලේඛන සහ වාර්තා ඉදිරිපත් කළ යුතු ය.

19. දැනට බලපත්‍ර දරන්නන් විසින් ඉදිරිපත් කළ යුතු ලේඛන සහ වාර්තා (සියලුම බලපත්‍ර වර්ග සඳහා)

(අ) 13 (1) ඡේදයේ (ආ), (ඇ) හා (ඒ) උප ඡේදවල දක්වා ඇති ලේඛන සහ වාර්තා,

(ආ) ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන වර්ෂයට වහාම පෙරාතුව වර්ෂ 03 තුළදී, අදාළ පරිශ්‍රයේ දී සොයා ගන්නා ලද සුරාබදු වැරදි පිළිබඳව සහකාර සුරාබදු කොමසාරිස්ගේ වාර්තාව

20. *පිහිටීම සහ පරිශ්‍රය සම්බන්ධයෙන් අවශ්‍යතා* :

(අ) පරිශ්‍රයේ පිටත මත්පැන් විකිණීම සඳහා වන සිල්ලර වෙළඳසැල්වලට අවම වශයෙන් වර්ග අඩි 250 ක ගෙබිම් ඉඩකඩ තිබිය යුතුය පරිශ්‍රයේ පාරිභෝජනය සඳහා මත්පැන් විකුණන පරිශ්‍රවල අවම වශයෙන් වර්ග අඩි 500 ක ගෙබිම ඉඩකඩ තිබිය යුතුය මෙම අවශ්‍යතාවය, බියර්, ඒල්, ස්ටවුට් හා වයින් සිල්ලරට විකිණීමේ බලපත්‍ර (රබ් 22ඒ) සඳහා අදාළ නොවේ.

(ආ) සංචාරක මණ්ඩලයේ නොවන රබ් 7 හෝ රබ් 8 බලපත්‍ර සහ රබ් 11 ආපනශාලා බලපත්‍ර සඳහා ඉල්ලුම්කරුවන් බලපත්‍ර පරිශ්‍රයේ පිහිටීම හා ස්ථානගත කිරීම සම්බන්ධයෙන් IV උප ලේඛනයේ දැක්වෙන අමතර අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. හෝටල් බලපත්‍ර, ආපනශාලා බලපත්‍රවලින් වෙන්කර සලකුණු ලබන්නේ, ආගන්තුකයන්ගේ පාවිච්චි සඳහා අවම වශයෙන් කාමර පහක් වත් ඇත්නම් පමණි.

(ඇ) පරිශ්‍රයෙන් පිටත විකුණන මත්පැන් සඳහා වන බලපත්‍ර ක්‍රියාත්මක කිරීමට පිහිටුවා ගැනීම කළ යුත්තේ, පාසැල් සහ ප්‍රසිද්ධ පූජනීය ස්ථානවලින් (මායිමෙන් මායිමට කෙළින් දුර ගත්විට) මීටර් 100ක් ඇතින් ය. පරිශ්‍රයේ පරිභෝජනය සඳහා මත්පැන් විකුණන බලපත්‍ර දරන්නන් සම්බන්ධයෙන් එම දුර ප්‍රමාණය මීටර් 500 කි. ( මායිමෙන් මායිමට කෙලින් දුර ගත්විට)

කෙසේ වෙතත්, දැනට නිකුත් කර ඇති පහත සඳහන් ගණයන්ට අයත් බලපත්‍ර සම්බන්ධයෙන් මහජනයා විසින් නිශ්චිත වශයෙන් විරෝධයන් නොදක්වන බවට සෑහීමකට පත් වන්නේ නම්, මෙම දුර ප්‍රමාණ ලිහිල් කිරීම සම්බන්ධයෙන් සලකා බැලීමට සුරාබදු කොමසාරිස් ජනරාල්ට හැකිය.

(i) සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ (කලින් සංචාරක මණ්ඩලය ) අනුමැතිය සහිතව පිහිටුවා ඇති බලපත්‍ර;

(ii) එකම ස්ථානයේ වසර 10කට වැඩි කාලයක් පවත්වාගෙන ගිය බලපත්‍ර

(iii) පාසැල් හෝ පූජනීය ස්ථාන පිහිටුවීමට පෙර ස්ථාපිත කරන ලද බලපත්‍ර

21. බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර හෝ නිකුත් කිරීමෙන් පසුව හෝ යම් මහජන සංවිධානයක සාමාජිකයකු, එම බලපත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් සුරාබදු ආඥාපනතේ විධිවිධාන උල්ලංඝණය හෝ මෙහි ඇති මාර්ගගෝපදේශ කොන්දේසි උල්ලංඝනය වී ඇති බවට පැමිණිලි සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත ලැබුණහොත්, සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ බව ඉල්ලුම්කරුට/බලපත්‍රකරුට දන්වා පැමිණිල්ල සම්බන්ධයෙන් පරීක්ෂණයක් කිරීමෙන් අනතුරුව, පරීක්ෂණයේ ප්‍රතිඵල මත තීරණයක් ගනු ඇත. තවද, බලපත්‍ර ස්ථානය විවෘත කිරීම/ පවත්වාගෙන යෑම නිසා ප්‍රදේශයේ නීතිය හා සාමය පවත්වාගෙන යාමට බාධා ඇති වන බවට එවැනි පරීක්ෂණ දී නිශ්චිතව අනාවරණය වන්නේ නම් බලපත්‍ර ස්ථානය, ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට සුරාබදු කොමාසාරිස් ජනරාල්ට පුළුවන. සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් ගනු ලබන තිරණය අවසාන තීරණය වන්නේ ය.

22. දැනටමත් ක්‍රියාත්මකව පවත්වාගෙන එන බලපත්‍රලත් ස්ථානයක් සම්බන්ධයෙන් බලපත්‍රයක් සඳහා කරන ඉල්ලුම්පත්‍ර එම ස්ථානයේ දැනටමත් ක්‍රියාත්මකව පවතින බලපත්‍රය හෝ මීට කලින් ක්‍රියාත්මක ව පැවැති බලපත්‍රය හෝ ඉල්ලුම්කරුගේ නමට ඇති වෙනත් බලපත්‍රයක් හෝ වෙනුවෙන් ලැබීමට ඇති සියළුම අයවීම් සම්පූර්ණයෙන්ම ගෙවා නිරවුල් කර තිබිය යුතුය.

23. දැනටමත් ක්‍රියාත්මකව පවතින එවැනි බලපත්‍ර සම්බන්ධයෙන් තවමත් විභාග වෙමින් පවතින පරීක්ෂණයක් තිබේ නම්, එම පරිශ්‍රයේම බලපත්‍රයක් ක්‍රියාත්මක කිරීමට හෝ ඉල්ලුම්කරුගේ නමින් වෙනත් බලපත්‍රයක් ක්‍රියාත්මක කිරීම හෝ සලකා බලන්නේ 1990 අංක 37 දරන සුරාබදු (සංශෝධන ) පනතට අනුකූලව සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් නියම කළ හැකි සමථ ගාස්තුවකට අනුරූප ඇප තැන්පතුවක් මත හා එවැනි පරීක්ෂණයක ප්‍රතිඵලවලට යටත්ව ය.

24. දැනටමත් බලපත්‍රයක් ලත් ඉල්ලුම්කරුවෙකුගේ නමින් දිස්ත්‍රික්කයේ ඇතුළත තවත් බලපත්‍රයක් ලබා ගැනීමට කරන ඉල්ලීමක් සලකා බලනුයේ, එම අවසරය දී ඇති සංඛ්‍යාව ඇතුළත වෙනත් සුදුසු ඉල්ලුම්කරුවෙකු නැත්නම් පමණි.

25. කෙසේ වුවද, දිස්ත්‍රික්කයක් ඇතුළත ඉල්ලුම්කරුවෙකුට බලපත්‍ර දෙකකට වඩා නිකුත් කිරීමෙන් එම දිස්ත්‍රික්කය ඇතුළත මත්පැන් ඒකාධිකාරයකට හෝ අනවශ්‍ය මත්පැන් පාලනයකට හෝ නිදහස් බාධා රහිත සැපයුම් බෙදා හැරීමේ හෝ පාරිභෝජනයට හෝ අවහිර ඇති වීමේ තත්ත්වයකට තුඩු දිය හැකි යැයි සුරාබදු කොමසාරිස් ජනරාල් අදහස් කරන්නේ නම්, එක් ඉල්ලුම්කරුවකුට දිස්ත්‍රික්කයක් ඇතුළත බලපත්‍ර දෙකකට වඩා නිකුත් නොකරනු ඇත.

26. දිස්ත්‍රික්කය ඇතුළත හෝ පිටත හෝ බලපත්‍ර දෙකක් ලද ඉල්ලුම්කරුවකු විසින්, බලපත්‍රයක් සඳහා කරන ඉල්ලුම්පත් ඇගයීමේ දී සහ සලකා බැලීමේදී සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් සුරාබදු ප්‍රතිපත්තියට අහිතකර විය හැකි සියළුම හෝ ඕනෑම ආර්ථික සාධකයක්, සමාජීය සුබසාධනය, සංස්කෘතිය, ආගම, මත්පැන් කර්මාන්තයේ අවශ්‍යතා, සමාජයේ සහ පාරිභෝගිකයාගේ ආරක්ෂාව, ඒකාධිකාරී තත්ත්වයන් සහ මත්පැන් කර්මාන්තය මත සහ පරිභෝජනය මත අනවශ්‍ය බලපෑම් යන කරුණු සලකා බැලිය යුතු අතර, ඔහුගේ අදහසට අනුව අවස්ථානුකූල යැයි හැඟේ නම්, එම ඉල්ලුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.

27. මත්පැන් විකිණීම සඳහා ලබා දෙන ලද බලපත්‍ර පරිශ්‍රයක පිහිටීම වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. කෙසේවෙතත්, ස්වභාවික විපතක් හේතුවෙන් හෝ රජයේ සංවර්ධන කටයුත්තක් හෝ සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් සාධාරණ යැයි සලකනු ලබන වෙනත් හේතුවක් නිසාත් බලපත්‍රලත් ස්ථානයක් වෙනස් කිරීමට එකී බලපත්‍රය ක්‍රියාත්මක වූ ප්‍රාදේශීය ලෙකම් කොට්ඨාසය තුල පමණක් ඉඩදිය හැක. එවැනි ඉල්ලීම් සලකා බැලීම සඳහා බලපත්‍ර දරන්නා විසින් රු. 7,500ක් ගෙවා ඉල්ලුම්පත්‍රයක් ලබා ගත යුතුය. එම වෙනස් කිරීම සඳහා අවසර ලබා දෙනුයේ අදාල පරිශ්‍රය මෙම මාර්ගෝපදේශ හා කොන්දේසි වලට අනුකූළ වන්නේ නම් පමණි. එම වෙනස් කිරීමේ ගාස්තුව වශයෙන් රුපියල් 1,00,000/- ක් ගෙවිය යුතු ය. පරිශ්‍රය වෙනස් කිරීමට ඉඩු දෙනු නොලැබීමේ කොන්දේසිය, මත්පැන් නිෂ්පාදන බලපත්‍රවලට අදාල නොවේ.

28. බලපත්‍රයක් වෙනත් තැනැත්තෙකුට පවරා දීමක් සඳහා වන ඉල්ලීමක් සලකා බලනුයේ රු. 7,500/ ක් ගෙවා අලුත් ඉල්ලුම්කරු නමින් ඉල්ලුම්පතක් ලබා ගැනීම හා එම අලුත් ඉල්ලුම්කරු මෙම නිවේදනයේ සඳහන් බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය වෙනත් අවශ්‍යතා සපුරාලන්නේ නම් පමණි.

29. අලුත් ඉල්ලුම්කරු බලපත්‍රය පවරන්නාගේ නෛතික උරුමක්කාරයෙක් නොවන්නේ නම්, අලුත් ඉල්ලුම්කරුට බලපත්‍රය මාරු කිරීම වෙනුවෙන් ගාස්තු වශයෙන් ර.බී. 04 බලපත්‍ර සම්බන්ධයෙන් රු. 5,00,000/- ක්ද, අනෙකුත් බලපත්‍ර සම්බන්ධයෙන් රු. 1,50,000/-ක අමතර මුදලක් ද රජයට ගෙවිය යුතුය.

IV වන උපලේඛනය

*ආපනශාලා/හෝටල් අනුමත කිරීම සඳහා වූ නිර්නායක*

1. *පිහිටීම* :

(අ) පිහිටීම සහ අවට පරිසරය ආපනශාලාවක් / හෝටලයක් සඳහා විය යුතුය ;

(ආ) ගොඩනැගිල්ලේ පෙනුම සහ ඉදිකිරීම් හොඳ තත්ත්වයෙන් තිබිය යුතුය.

2. *ප්‍රමාණය* :

(අ) ගෙබිම අවම වශයෙන් වර්ග අඩි 500ක් විය යුතු ය;

(ආ) එක් වරකට යටත් පිරිසෙයින් පුද්ගලයන් 25කට වත් අසුන් ගැනීමට හැකිවන පරිදි, පුටු සහ මේස පිළිවෙලකට තැබිය හැකි තරම් ඉඩ පහසුකම් තිබිය යුතුය.

3. *ගොඩනැගිල්ල සවි කිරීම සහ තහවුරු* :

(අ) පරිශ්‍රයේ සියළු කොටස් ඇතුළුව ගේ දොර (එනම් ගොඩනැගිල්ල, ගෘහ භාණ්ඩ, දොර ජනෙල් රෙදි, උපකරණ ගෙයි සවි කොට ඇති බඩු රාක්ක තිරවුරු ආදිය) උසස් මට්ටමින් නියමාකාරයෙන් නඩත්තු කළ යුතුය ;

(ආ) ප්‍රමාණවත් තරම් විදුලි පංකා හෝ වායු සමීකරණ පහසුකම් හෝ තිබිය යුතුය ;

(ඇ) මේස හා පුටු මෙන්ම පරිහරණය කරන ගෘහ භාණ්ඩ, උපකරණ සියල්ලම යෝග්‍ය ලෙස උසස් මට්ටමින් තිබිය යුතුය ;

(ඈ) නියම ආකාරයට වාතාශ්‍රය ලැබීමේ පහසුකම් සලසා තිබිය යුතුය ;

(ඉ) සජීවී හෝ පටිගත කළ සංගීතය ශ්‍රවණය කිරීමේ පහසුකම් තිබිය යුතුය ;

(ඊ) ගේ දොර සහ ඊට අයත් ඉඩකඩ ඉතා කුඩා ප්‍රාණීන්, කෘමීන් සහ ලැටි ගාන වර්ගයේ සතුන් ගෙන් තොර විය යුතුය.

4. *වැසිකිළි* :

(අ) නවීන සනීපාරක්ෂක පහසුකම් සහිතව වැසිකිළි තිබිය යුතු අතර, ගැහැණු සහ පිරිමි අය වෙනුවෙන් වෙනම වැසිකිළි තිබිය යුතුය;

(ආ) වැසිකිළි විශිෂ්ඨ තත්ත්වයෙන් නඩත්තු කළ යුතු අතර, එහි සියළු සවිකිරීම් හා උපකරණයන් මනා ක්‍රියාකාරී තත්ත්වයෙන් තිබිය යුතුය.

(ඇ) වැසිකිළි සියල්ලටම නළ ජලය, සබන්, තුවා ආදිය සපයා තිබිය යුතුය ;

(ඈ) කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනය පිණිස නවීන සනීපාරක්ෂණ පහසුකම් සහිත වෙනම වැසිකිළි තිබිය යුතුය.

5. *මුළුතැන්ගෙය* :

(අ) මුළුතැන්ගෙය සංග්‍රහ කිරීමේ ස්ථානයෙන් වෙන්ව තිබිය යුතු අතර පිරිසිදුව නඩත්තු කල යුතුය;

(ආ) පිඟන්, කෝප්ප, හැඳි, ගෑරුප්පු, පිහියා සහ වීදුරු බඩු ද උසස් වර්ගයේ ඒවා විය යුතු අතර, කැඩුණු බිඳුණු ඒවා නොවිය යුතුය ;

(ඇ) මේස රෙදි උසස් වර්ගයේ රෙදි වලින් පිළියෙල කරගත් ඒවා විය යුතු අතර, පිරිසිදුවටද තිබිය යුතු ය;

(ඈ) මුළුතැන්ගෙය සහ පැන්ට්‍රිය කාර්යක්ෂම ලෙස සහ සනීපාරක්ෂක ලෙස ආහාර පිළියෙල කරගත හැකි පරිදි අවශ්‍ය භාණ්ඩ සපයා මැනවින් සැලසුම් කර තිබිය යුතු අතර එය පිරිසිදුව සහ සනීපාරක්ෂක ලෙස මනාව නඩත්තු කළ යුතුය ;

(ඉ) මුළුතැන්ගෙය සුදුසු දැව, ගෑස්, පොරණු, විදුලි උදුන්/ කුකර් ආදියෙන් සුදානම් කොට තිබිය යුතුය ;

(ඊ) මුළුතැන්ගෙයි බිම් සහ බිත්ති දුව උරා නොගන්නා ද්‍රව්‍ය වලින් තනා පිරිසිදුව තිබිය යුතුය ;

(උ) මුළුතැන්ගෙයි උපකරණ ප්‍රමාණවත් සහ උසස් වර්ගයේ ඒවා විය යුතු අතර, පිරිසිදුවට ද තිබිය යුතුය ;

(ඌ) මුළුතැන්ගෙයි මේස රාක්ක උසස් වර්ගයේ ද්‍රව්‍යවලින් තනා තිබිය යුතු අතර, දුව උරා නොගන්නා අසුරින් නිම කර තිබිය යුතුය ;

(එ) එහි ප්‍රමාණවත් තරම් ශීත ගබඩා පහසුකම් තිබිය යුතුය ;

(ඒ) පිගන්, කෝප්ප, හැඳි, ගෑරුප්පු, පිහියා, කෑම මේසයේ බඩු මුට්ටු, කෑම පිසින භාජන, උපකරණ, හැලි වලං ආදිය සේදීම සඳහා වෙනම පහසුකම් තිබිය යුතුය ;

(ඔ) කාර්ය මණ්ඩලයේ තැනැත්තන්ගේ අත් සෝදා පිරිසිදුකර ගැනීමට වෙනම පහසුකම් තිබිය යුතුය ;

(ඕ) පිගන් ආදිය සෝදන බක්කියේ සිට මුළුතැන්ගෙයි ජලය බැස යන නල සහ පිටවී යන කාණු මනා තත්ත්වයෙන් තිබිය යුතු අතර, ඒවා ගොඩනැගිල්ල තුළදී නිරාවරණය නොවී තිබිය යුතු ය.

6. *ආහාර* :

(අ) අමුත්තන්ට පිළිගන්වන ආහාර උසස් තත්ත්වයෙන් සෞඛ්‍යමය, පිරිසිදු ඒවා විය යුතුය ;

(ආ) ආපනශාලා/ හෝටල විවෘතව තබන විට සංග්‍රහ කිරීම සඳහා අවශ්‍ය ආහාර සැම විටම තිබිය යුතුය ;

(ඇ) පානීය ජලය උණු කර පෙරා නැතහොත් වෙනත් අයුරු පානයට සුදුසු පරිදි සැම විටම සකස්ව තිබිය යුතුය.

*සාමාන්‍ය:*

(අ) පරිශ්‍රයේ ශෝභාවත්, සිත් ඇදුම් කරන ආකාරයේ වාතාවරණයක් තිබිය යුතුයි

(ආ) මත්පැන් නිකුත් කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් ලෙස සහකාර සුරාබදු කොමසාරිස්, සුරාබදු අධිකාරි සහ ස්ථාන භාර සුරාබදු ස්ථානාධිපති යන අයගෙන් සමන්විත කමිටුවක් මගින් ඉහත නියමයන් පිළිබඳව අනුකූලතා සහතිකයක් නිකුත් කරනු ඇත.

04 - 697

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.